

# කුශලත්‍රිකය.

# KUSALATHRIKAYA

# කුශලත්‍රිකය

හෙවත්

අභිධර්‍මයෙහි මුල් මාතෘකාව.

රත්මලානේ පුෂ්පාරාමාධිපති
විබුධ සෙනාචරිය ධම්මාධාරාභිධානස්ථවිර
පාදයන් වහන්සේ විසින්
සම්පාදනය කරණලදි.

—o—

බුධශාසනමහාධූර සෙනාපති
ඇම්. ධර්‍මරත්න පඬිතුමා
විසින්
පසස්නාලදි.

රත්මලානේ ශ්‍රුතධර්‍මදූත සමිතියේ
ලේකම් තැත්පත්
හෙන්ද්‍රික් මැන්දිස් වෛද්‍යනැනවිසින්
කොළඹ
සිහල සමය යන්ත්‍රාලයෙහි
මුද්‍රණය කරවනලදි.

ශ්‍රී. බු. 2449.

ක්‍රි. ව. 1905.

# කුශලත්‍රිකය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

---o---

සමතිංසති පාරමිසම්භරණං
වරබොධිදුමෙ චතුසච්චදසං
පණමිත්වජිනං නරදෙවහිතං
කථයාමි සුභං කුසලාදිතිකං.

බෞද්ධයන්විසින් අනවරතයෙන් භාවිතාකට යුතුවූ මේ කුශලත්‍රිකයයි කියනලද අභිධර්මපිටකයෙහි මුල්මාතෘකාව විශෙෂවශයෙන් දැනගත් බෞද්ධයෝ ඉතා ස්වල්පයහ. එබැවින් සකල බෞද්ධ ජනයාගේ ප්‍රයොජනය සළකා ඒ කුශලත්‍රිකය ඉතා සංක්ෂෙප වශයෙන්දක්වනුලැබේ. යමෙක්තෙමමෙහි කියනලද කුශලත්‍රිකය අවබොධකරගත්තේවීනම් හෙතෙම අභිධර්මයෙහි මුල් මාතෘකාවෙහි දක්‍ෂවේ.

## අභිධර්මයෙහි නිදානය.

“එකං සමයං භගවා දෙවෙසු විහරති තාවතිංසෙසු පාරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බල සිලායං. තත්‍ර ඛො භගවා දෙවානං තාවතිංසානං අභිධම්මකථං කථෙසි. කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මාති”–යනුවෙන් එක් ධර්මදෙශනා සමයෙක්හි දානශීලාදිබොධිසම්භාරසම්භරණයෙන් කොටිප්‍රාප්තභාග්‍යඇති සර්වඥයන්වහන්සේ ත්‍රයස්ත්‍රිංශත් දිව්‍ය ලොකවාසී දෙවියන් කෙරෙහිවූ පාරිච්ඡත්තකනම් දිව්‍යද්‍රැම මූලයෙහිවූ පාණ්ඩුකම්බල ශෛලාසන මස්

තනහෙහි වැඩවාසයකරණුයේතව්තිසාවේසි දේශීය ත්වවිසිෂ්ඨාපීයෙන් යුක්තවූ 'ධර්මදේශනාව නො හොත්අභිධර්මකථාව අෂ්ටාංගස්වරයෙන් දේශ නාකලසේක.

## කුශලත්‍රිකයේ අපිනම්.

කුසලාධම්මා, අනවද්‍ය සුඛවිපාක ලක්ෂණවූ නිස්සත්ව නිජ්ජීව ස්වභාවධර්මයෝ [අප්‍රි,ඇත්තාහුය] අකුසලාධම්මා, සාවද්‍යදුඃඛවිපාක ලක්ෂණවූ නිස්සත්ව නිජ්ජීව ස්වභාවධර්මයෝ (ඇත්තාහුය) අබ්‍යාකතා ධම්මා, කුශලා කුශලවශයෙන් නොවදරණ ලද්දාවූ විපාක ක්‍රියාරූප නිර්වාණ සංඛ්‍යාත නිස්සත්ව නිජ්ජීව ස්වභාව ධර්මයෝ[ඇත්තාහුය.]

"කුච්ජිතෙ පාපධම්මෙ සලයන්ති කම්පෙන්ති විධංසෙන්ති අපගමෙන්තීතිකුසලා" යනුමෙන් පිළිකුල් කටයුතු අකුශලධර්මයන් නිරුද්ධකරවන්නාහුවෙද්ද [පහකරන්නාහු වෙතියි කීතියාගී] සොල වන්නාහු වෙද්ද විනාසකරවන්නාහුවෙද්ද නිරව ශෙෂයෙන්ප්‍රහීණ කරවන්නාහු වෙද්ද එහෙයින් කුසල්නම්වෙත්. ප්‍රදීපාලෝකයෙන් (පහන්එළි යෙන්] අන්ධකාරය පහව යන්නාක්මෙන් ශ්‍රද්ධා වෙන් අශ්‍රද්ධාවදඥානයෙන් මුළාවද යනාදී තදඞ්ගප්‍රහාණාදීන්ගේවශයෙන්ඒ ඒ කුශලචෛත සිකයන් විසින් අකුශල චෛතසිකයන් පහකරණ ලද හෙයින් කුප්‍රුම් සලධාතුවෙන් කුසලශබ්දය නිපන්නේයයි කියති. ධර්මයෝනම්.

"අත්තනො සභාවං ධාරෙන්තීති ධම්මා" යනු වෙන් ඊශ්වරාදීහෙතුවිරහිතව තමාගේස්වභාවදරණ අර්ථයෙන් ධර්මනම්වේ. ධරධාතුවෙන්සිද්ධයි.

තවද"අත්තානං ධාරෙන්ත චතුසුඅපායෙසුවට්ට

දුක්ඛසුවඅපතමානෙ කත්වාධාරෙතීතිධම්මො" යම් ධර්‍මයක් යෙමේ තමා දරත්නැවුත් නරක තිර්‍යග්ක් ප්‍රෙත අසුර නිකායයන සතර අපාය යන්හිද ජාත්‍යාදී වෘත්තදුඃඛයන්හිද නොවැටෙන්නවුත් කොට දරන්නේවේද ඒ සවභාව තෙමේ ධර්‍මම්වේ. සතරමග සතරඵල නිර්‍වාණ යන නොවුන්ගේ වශයෙන් නවප්‍රකාරවූ ධර්‍මයලැබේ. නොහොත් සූත්‍රාභිධර්‍ම විනය සඞ්ඛ්‍යාත ත්‍රිපිටක පර්‍යාප්තියහා සමග දශප්‍රකාරවූ ඒ ධර්‍මයතෙම ලැබේ. අපායාදියෙහි ඉපිදවීංගැකිවූ කෙලෙසුන්ගේ නැසීමම ඒ ධර්‍මයාගේ දැරීම වෙයි. අපායාදී යන්නෙහි ආදිශබ්දයෙන් වෘත්තදුඃඛාදිය ගන්නාලැබේ.

"නකුසලා(කුසලපටිපක්ඛාවා )අකුසලා, මිත්තපටිපක්ඛා අමිත්තාවිය" යනුවෙන් කුසල් නොවන්නේ අකුසල්නම්වෙත්, කුසලයන්ට ප්‍රතිපක්‍ෂවූවාහු හෝවෙත්. කුමක්මෙන්දයත්?මිත්‍රයාට විරුඬවූ සතුරෙක් මෙනි. කුශලාකුශලයන්ගේ ප්‍රතිපක්‍ෂභාවය ප්‍රහායක ප්‍රහාතව්‍යභාවයෙන් දතයුතුයි.

විසෙසෙන ආකතා [පකාසිතා) ති,ව්‍යාකතා, කුසලාකුසල භාවෙන නබ්‍යාකතාති අබ්‍යාකතා" යනුවෙන් විශෙෂයෙන් ප්‍රකාශකරණ ලද්දහු ව්‍යාකෘතනම්වෙත්,කුසලාකුසල භාවයෙන් ප්‍රකාශනොකරණ ලද්දහු අව්‍යාකෘතනම්වෙත්. අව්‍යාකෘතයනු කුශලභාවයෙන් හෝ අකුශලභාවයෙන් හෝ නොවදල ධර්‍මයයි. කුසලභාවයනම් අනවද්‍ය සුඛවිපාකබවයි. අකුසලභාවයනම් සාවද්‍ය දුක්ඛවිපාකබවයි. ඒ දෙයාකාරයෙන් නොවදල ධර්‍ම අව්‍යාකෘතයයි කියත්. සියලු මනුෂ්‍යයන්ගේ වෙනස්ගති ඇති නුමුත් මනුෂ්‍යාකාරයෙන් සමාන බැවින් මනුෂ්‍යජාතියයි කියන්නාක්මෙන් සියලු සිත් ඔවුනො

වූත් වෙනස්වූවාහුද කුසල්ය අකුසල්ය අව්‍යාකෘත යයන ජාතීන්ගේ වශයෙන් තුන්ආකාරවේ. ඒ තුන්ආකාරය මේ කුසලත්‍රිකමයයි වදාරණලදී.

## සතරපරමාර්ථනම්.

":තත්වුත්තාභිධම්මත්ථා චතුධාපරමත්ථතො
චිත්තංචෙත සිකං රූපං නිබ්බාණමිති සබ්බථා";

මෙහිභාවය–ඒඅභිධර්ම සප්තප්‍රකරණයෙහි තථාගතයන්වහන්සේ විසින් සම්ප්‍රකාරයෙන් කුශලාදීන්ගේ වශයෙන් හා ස්කන්ධාදීන්ගේ වශයෙන්ද වදාරණලද්දවූ අභිධර්මාර්ථයෝ සම්මුති ප්‍රඥප්තිය හැර හෙවත් සම්මුති ප්‍රඥප්තියෙන් වෙන්කොට ගන්නාලද්දවූ අවිපරීත [නොපෙරළෙන) අර්ථයාගේ වශයෙන් විඥානස්කන්ධයද, වේදනාදිස්කන්ධත්‍රයාගේ සමූහයද, රූපස්කන්ධයද, මාර්ගඵලයන්ට අරමුණුවූ අසඞ්ඛත ධර්මයද ය මෙසේ සතරාකාරයකින් සිටින්නාහුයයි දක්වනලදී.

## භූමිවශයෙන් සිත්බෙදීමනම්.

"තත්ථ චිත්තංතාවචතුබ්බිධංහොති කාමාවචරං රූපාවචරං අරූපාවචරං ලොකුත්තරං චෙති" යනුවෙන් ඒ අභිධර්මාර්ථයන් අතුරෙහි පළමුකොට චිත්තයතෙම 'කාමාවචර චිත්තය රූපාවචර චිත්තය අරූපාවචර චිත්තය ලොකොත්තර චිත්තයයි සතර වැදෑරුම්වේ. ජාතිවශයෙන් කුසල්ය අකුසල්ය අව්‍යාකෘතයයි මෙසේ තුන්ප්‍රකාරවූ ධර්මයන් අතුරෙන් කුසලජාතික ධර්මසමූහය භූමිභෙදයෙන් කාමාවචර භූමියෙහි පැවතිධර්මය රූපාවචර භූමියෙහි පැවති ධර්මය අරූපාවචර භූමියෙහි පැවති ධර්මය ලොකොත්තර භූමියෙහි පැවති ධර්මයයි සතරාකාරවේ. යම් තැනක ධර්මයන්ගේ හටගැන්මවේනම් ඒ ස්ථානය ඒ ධර්මයන්ට භූමිනම් වේ. මෙසේ ගත්කල ලොකොත්තර ධර්මයන් හටග

ත්තා භූමියක් ඇතැයි සිතිය හැකිවේ. නුමුත් එබඳු ස්ථානයක් නොමැතියි. එහෙයින් මෙහිසි සතරාකාර ධර්මයන් අතුරෙන් කාමාවචර රූපාවචර අරූපාවචර යන ලෞකික ධර්මයන් ස්ථානවශයෙන්හා අවස්ථාවශයෙන්ද ලෝකොත්තර ධර්මයන් අවස්ථාමාත්‍රවශයෙන්ද භූමිධර්මවනබව දතයුතුයි. ඊට ඇතුළත් අසූනවයක් ප්‍රභෙදවූ චිත්තවිභාගය අනුරුද්ධාචාර්යයන්වහන්සේ විසින් අභිධර්මාර්ථසංග්‍රහයෙහි දැක්වූ පරිද්දෙන් මෙහි ප්‍රකාශකරනුලැබේ.

## ලොභමූලික සිත් 8 නම්.

සොමනස්ස සහගත දිට්ඨි සම්පයුත්ත අසඞ්ඛාරිකසිත් 1 යි. සොමනස්සසහගත දිට්ඨි සම්පයුත්ත සසඞ්ඛාරිකසිත් 1 යි. සොමනස්ස සහගත දිට්ඨි විප්පයුත්ත අසඞ්ඛාරික සිත් 1 යි. සොමනස්ස සහගත දිට්ඨි විප්පයුත්ත සසඞ්ඛාරික සිත් 1 යි. උපෙක්ඛාසහගත දිට්ඨි සම්පයුත්ත අසඞ්ඛාරික සිත් 1 යි. උපෙක්ඛාසහගත දිට්ඨි සම්පයුත්ත සසඞ්ඛාරික සිත් 1 යි. උපෙක්ඛා සහගත දිට්ඨි විප්පයුත්ත අසඞ්ඛාරික සිත් 1 යි. උපෙක්ඛා සහගත දිට්ඨි විප්පයුත්ත සසඞ්ඛාරික සිත් 1 යි.

මේලොභමූලික සිතේ, සොමනස්ස 4 යි. උපෙක්ඛා 4 යිදිට්ඨි සම්පයුත්ත 4 යි. දිට්ඨි විප්පයුත්ත 4 යි.8. අසඞ්ඛාරික 4 යි. සසඞ්ඛාරික 4 යි. සිත් 8.

## වෙෂමූලික සිත් 2 නම්.

දොමනස්ස සහගත පටිඝසම්පයුත්ත අසඞ්ඛාරික සිත්1 යි. දොමනස්ස සහගත පටිඝසම්පයුත්ත සසඞ්ඛාරිකසිත් 1 යි: මේ වෙෂමූලික සිතේ–දොමනස්ස 2යි.පටිඝසම්පයුත්ත 2 යි. අසඞ්ඛාරික 1 යි. සසඞ්ඛාරික 1 යි. සිත්2 යි.

## මොහමූලික සිත් 2 නම්.

උපෙක්ඛාසහගත විචිකිච්ඡා සම්පයුත්ත සිත් 1 යි. උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත සිත් 1 යි මෙහිද උපෙක්ඛා 2 යි. විචිකිච්ඡා 1 යි. උද්ධච්ච 1 යි. සිත් 2 යි. මේ දොළොස්අකුසල් සිත්නම්වෙත්.

වුත් වෙනත්වූවාහුද කුසල්ය අකුසල්ය අව්‍යාකෘත යයන ජාතීන්ගේ වශයෙන් තුන්ආකාරවේ. ඒ තුන්ආකාරය මේ කුසලත්‍රිකයෙහි වදරණලදී.

## සතරපරමාර්ථනම්.

":තත්වුත්තාභිධම්මත්ථා චතුධාපරමත්ථතො
චිත්තංචෙත සිකං රූපං නිබ්බාණමිති සබ්බථා",

තෙහිභාවය—ඒඅභිධර්ම සප්තප්‍රකරණයෙහි තථාගතයන්වහන්සේ විසින් සර්වප්‍රකාරයෙන් කුශලාදීන්ගේ වශයෙන් හා ස්කන්ධාදීන්ගේ වශයෙන්ද වදරණලද්දවූ අභිධර්මාර්ථයෝ සම්මුති ප්‍රඥප්තිය හැර හෙවත් සම්මුති ප්‍රඥප්තියෙන් වෙන්කොට ගන්නාලද්දවූ අවිපරීත [නොපෙරළෙන) අර්ථයාගේ වශයෙන් විඥානස්කන්ධයද, වෙදනාදිස්කන්ධත්‍රයාගේ සමූහයද, රූපස්කන්ධයද, මාර්ගඵලයන්ට අරමුණුවූ අසඞ්ඛත ධර්මයද යන මෙසේ සතරාකාරයකින් සිටිනාහුයයි දක්වනලදී.

## භූමිවශයෙන් සිත්බෙදීමනම්.

"තත්ථ චිත්තංතාවචතුබ්බිධංහොති කාමාවචරං රූපාවචරං අරූපාවචරං ලොකුත්තරං චෙති" යනුවෙන් ඒ අභිධර්මාර්ථයන් අතුරෙහි පළමුකොට චිත්තයතෙම කාමාවචර චිත්තය රූපාවචර චිත්තය අරූපාවචර චිත්තය ලොකොත්තර චිත්තයයි සතර වැදෑරුම්වේ. ජාතිවශයෙන් කුසල්ය අකුසල්ය අව්‍යාකෘතයයි මෙසේ තුන්ප්‍රකාරවූ ධර්මයන් අතුරෙන් කුසලජාතික ධර්මසමූහය භූමිභෙදයෙන් කාමාවචර භූමියෙහි පැවතිධර්මය රූපාවචර භූමියෙහි පැවති ධර්මය අරූපාවචර භූමියෙහි පැවති ධර්මය ලොකොත්තර භූමියෙහි පැවති ධර්මයයි සතරාකාරවේ. යම් තැනක ධර්මයන්ගේ හටගැන්මවේනම් ඒ ස්ථානය ඒ ධර්මයන්ට භූමිනම් වේ. මෙසේ ගත්කල ලොකොත්තර ධර්මයන් හටග

න්නා භූමියක් ඇතැයි සිතියහැකිවේ. නුමුත් එබඳු
ස්ථානයක්නොමැතියි. එහෙයින් මෙහිසි සතරාකාර
ධර්මයන් අතුරෙන් කාමාවචර රූපාවචර අරූපාව
චර යන ලෞකික ධර්මයන් ස්ථානවශයෙන්හා අව
ස්ථාවශයෙන්ද ලොකොත්තර ධර්මයන් අවස්ථා
මාත්‍රවශයෙන්ද භූමිධර්ම්වනබව දතයුතුයි. ඒව ඇතු
ලත් අසූනවයක් ප්‍රභෙදවූ චිත්තවිභාගය අනුරුඬා
චාර්‍ය්‍යයන්වහන්සේ විසින් අභිධර්මාර්ථසඞ්ග්‍රහයෙහි
දැක්වූපරිද්දෙන් මෙහි ප්‍රකාශකරණුලැබේ.

## ලොහමූලික සිත් 8 නම්.

සොමනස්ස සහගත දිඨි සම්පයුත්ත අස
ඞ්ඛාරිකසිත් 1 යි. සොමනස්සසහගත දිඨි සම්ප
යුත්ත සසඞ්ඛාරිකසිත් 1 යි. සොමනස්ස සහග
ත දිඨි විප්පයුත්ත අසඞ්ඛාරික සිත් 1 යි. සොම
නස්ස සහගත දිඨි විප්පයුත්ත සසඞ්ඛාරික සිත්
1 යි. උපෙක්ඛාසහගත දිට්ඨි සම්පයුත්ත අසඞ්ඛා
රික සිත් 1 යි. උපෙක්ඛාසහගත දිඨි සම්පයුත්ත
සසඞ්ඛාරික සිත් 1 යි. උපෙක්ඛා සහගත දිඨි
විප්පයුත්ත අසඞ්ඛාරික සිත් 1 යි. උපෙක්ඛා සහග
ත දිඨි විප්පයුත්ත සසඞ්ඛාරික සිත් 1 යි.

මේලොහමූලික සිත්හි, සොමනස්ස 4 යි.
උපෙක්ඛා 4 යිදිඨි සම්පයුත්ත 4 යි. දිඨි විප්පයු
ත්ත 4 යි.8. අසඞ්ඛාරික 4 යි. සසඞ්ඛාරික 4 යි.
සිත් 8.

## වෙෂමූලික සිත් 2 නම්.

දොමනස්ස සහගත පටිඝසම්පයුත්ත අසඞ්ඛා
රික සිත්1 යි. දොමනස්ස සහගත පටිඝසම්පයුත්ත
සසඞ්ඛාරිකසිත් 1 යි: මේවෙෂමූලික සිත්හි–දොමන
ස්ස 2යි.පටිඝසම්පයුත්ත 2 යි. අසඞ්ඛාරික 1 යි.
සසඞ්ඛාරික 1 යි. සිත්2 යි.

## මොහමූලික සිත් 2 නම්.

උපෙක්ඛාසහගත විචිකිච්ඡා සම්පයුත්ත සිත්
1 යි. උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත සිත් 1 යි
මෙහිද උපෙක්ඛා 2 යි. විචිකිච්ඡා 1 යි. උද්ධච්ච 1 යි.
සිත් 2 යි. මේ දොළොස්අකුසල් සිත්නම්වෙත්.

## අහෙතුක සිත් 18 නම.

උපෙක්ඛාසහගත අකුසලවිපාක චක්ඛුවිඤ්ඤාණසිත් 1 යි. උපෙක්ඛා සහගත අකුසල විපාක සොතවිඤ්ඤාණ සිත් 1 යි. උපෙක්ඛාසහගත අකුසලවිපාක ඝාණවිඤ්ඤාණ සිත් 1 යි. උපෙක්ඛාසහගත අකුසලවිපාකජිව්හා විඤ්ඤාණ සිත් 1 යි. දුක්ඛසහගතඅකුසලවිපාකකායවිඤ්ඤාණසිත් 1 යි. උපෙක්ඛාසහගත සම්පටිච්ඡනසිත් 1 යි. අකුසල විපාක උපෙක්ඛාසහගත සන්තීරණ සිත්1 යි. මොහු සත්දෙන අකුසලවිපාක සිත් නම් වෙත් උපෙක්ඛාසහගත කුසලවිපාක චක්ඛුවිඤ්ඤාණ සිත් 1 යි. උපෙක්ඛාසහගත කුසලවිපාක සොතවිඤ්ඤාණ සිත් 1 යි. උපෙක්ඛාසහගත කුසලවිපාක ඝාණවිඤ්ඤාණ සිත් 1 යි. උපෙක්ඛාසහගත කුසලවිපාක ජිව්හා විඤ්ඤාණසිත් 1 යි. සුඛසහගත කුසලවිපාක කායවිඤ්ඤාණ සිත් 1 යි. උපෙක්ඛාසහගත කුසලවිපාක සම්පටිච්ඡන සිත් 1 යි. සොමනස්ස සහගත කුසලවිපාක සන්තීරණ සිත් 1 යි. උපෙක්ඛාසහගත කුසලවිපාක සන්තිරණ සිත් 1 යි. මොහු අටදෙන කුසලවිපාක අහෙතුකසිත් නම්වෙත්.

උපෙක්ඛාසහගත පඤ්චද්වාරාවජ්ජන සිත් 1 යි. උපෙක්ඛාසහගත මනොද්වාරාවජ්ජන සිත් 1 යි. සොමනස්ස සහගත හසිතුප්පාද සිත් 1 යි. මොහුතුන් දෙනද අහෙතුක ක්‍රියාසිත්නම්වෙත්.

ථටකිදෙලොස්අකුසල් සිත්වල සොමනස්ස 4 යි. උපෙක්ෂා 6 යි. අටළොස් අහෙතුකසිත් වල උපෙක්ෂා 14 යි. සොමනස්ස 2 යි. දුක්ඛ 1 යි. සුඛ 1 යි. මේ සිත් 30 අසොභනසිත්නම්වෙත්. ඒ සිත්ඇතුලේ උපෙක්ෂා 20 යි. සොමනස්ස 6 යි. දොමනස්ස 2 යි. අහෙතුක පටිසන්ධි සිත් 2 යි.

## කාමාවචර කුසල්සිත් 8 නම

සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරිකසිත් 1 යි. සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසංඛාරික සිත් 1 යි. සොමනස්ස සහගත ඤාණවිප්පයුත්ත අසංඛාරික සිත් 1 යි සොමනස්ස සහගත ඤාණවිප්පයුත්ත සසංඛාරික සිත් 1 යි. උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත අසංඛාරික සිත් 1 යි. උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත සසංඛාරික සිත් 1 යි. උපෙක්ඛාසහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික සිත් 1 යි. උපෙක්ඛාසහගත ඤාණවිප්පයුත්ත සසංඛාරික සිත් 1 යි. මේ කුසල්සිත් 8 වෙත්,

## කාමාවචර විපාකසිත් 8 නම්.

සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාරික සිත් 1 යි, සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසංඛාරික සිත් 1 යි. සොමනස්ස සහගත ඤාණවිප්පයුත්ත අසංඛාරික සිත් 1 යි. සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත් 1 යි. උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත අසංඛාරික සිත් 1යි. උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත සසංඛාරිකසිත් 1 යි. උපෙක්ඛාසහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත් 1 යි. උපෙක්ඛාසහගත ඤාණ විප්පයුත්ත සසඞ්ඛාරිකසිත් 1 යි. මේ විපාකසිත් 8 නම්වෙත්.

## කාමාවචර ක්‍රියා සිත් 8 නම්.

සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාරික සිත් 1 යි. . සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසංඛාරිකසිත් 1 යි. සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරිකසිත් 1 යි, සොමනස්ස සහගත ඤාණවිප්පයුත්ත සසංඛාරික සිත් 1 යි. උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛා

රික සිත් 1 යි. උපෙක්ඛා සහගත ඥාණසම්පයුත්ත සසංඛාරික සිත් 1 යි. උපෙක්ඛා සහගත ඥාණවිප්පයුත්ත අසංඛාරික සිත් 1 යි. උපෙක්ඛාසහගත ඥාණවිප්පයුත්ත සසංඛාරික සිත් 1 යි. මේ හු අටදෙනද සහෙතුක කාමාවචර ක්‍රියා සිත් නම්වෙත්. කාමභවයෙහි උපදනා සිත්නම් —

"කාමෙතෙවීසපාකානි පුඤ්ඤාපුඤ්ඤානි වීසති
එකාදසක්‍රියාචෙති චතුපඤ්ඤාස සබ්බථා"

භාවය—කාමභවයෙහි විපාකසිත් තෙවිස්සෙක 23). කුසල් අකුසල් සිත් විස්සෙක (20). ක්‍රියාසිත් අහෙතුක තුන්දෙනය. (3) සහෙතුක අටදෙන (8) යයි මෙසේ එකළොසකැයි සර්වප්‍රකාරයෙන් සුපනසෙක් (54) වෙත්.

කාමාවචර කුසලවිපාක ක්‍රියාසිත් විසිසතරත් සොභනසිත් නම්වෙත්. ඒ සොභනසිතෙ සොමනස්ස (12) යි. උපෙක්ෂා (12) යි, ඥාණසම්පයුත්ත 12 යි. ඥාණවිප්පයුත්ත 12 යි. අසංඛාරික 12 යි. සසංඛාරික 12 යි. සිත් 24 යි. අසොභන සිතේ, සොමනස්ස 6 යි. සොභනසිතේ 12 යි. අසොභනසිතේ, උපෙක්ෂා 20 යි. සොභනසිතේ, උපෙක්ෂා 12 යි. උපෙක්ෂා 32 යි.

## රූපාවචර කුසල්සිත් 5 නම.

විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිත පඨමජ්ඣාන කුසල්සිත් 1 යි විචාර පීති සුඛෙකග්ගතා සහිත දුතියජ්ඣාන කුසල්සිත් 1 යි. පීතිසුඛෙකග්ගතා සහිත තතියජ්ඣාන කුසල්සිත් 1 යි. සුඛෙකග්ගතා සහිත චතුත්ථජ්ඣාන කුසල්සිත් 1 යි. උපෙක්ඛෙකග්ගතා සහිත පඤ්චමජ්ඣාන කුසල්සිත් 1 යි. මේ රූපාවචර කුසල්සිත් 5 නමවෙත්.

## රූපාවචර විපාක සිත් 5 නම්.

විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිත විපාක සිත් 1 යි. විචාර පීති සුඛෙකග්ගතා සහිත දුතියජ්ඣාන විපාකසිත් 1 යි. පීතිසුඛෙකග්ගතා සහිත තතියජ්ඣාන විපාකසිත් 1 යි. සුඛෙකග්ගතා සහිත චතුත්ථජ්ඣාන විපාකසිත් 1 යි. උපෙක්ඛෙකග්ගතා සහිත පඤ්චමජ්ඣාන විපාකසිත් 1 යි මේ රූපාවචර විපාකසිත් 5 නම්වෙත්.

## රූපාවචර ක්‍රියාසිත් 5 නම්.

විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිත පඨමජ්ඣාන ක්‍රියාසිත් 1 යි. විචාර පීති සුඛෙකග්ගතා සහිත දුතියජ්ඣාන ක්‍රියාසිත් 1 යි. පීතිසුඛෙකග්ගතා සහිත තතියජ්ඣාන ක්‍රියාසිත් 1 යි. සුඛෙකග්ගතා සහිත චතුත්ථජ්ඣාන ක්‍රියාසිත් 1 යි. උපෙක්ඛෙකග්ගතා සහිත පඤ්චමජ්ඣාන ක්‍රියාසිත් 1 යි. මේ රූපාවචර ක්‍රියාසිත් නම්වෙත්.

මේ රූපාවචරසිතේ උපෙක්ෂා 3 යි. සොමනස්ස 12 යි අශොභනසිතේ උපෙක්ෂා 20 යි. ශොභන සිතේත් උපෙක්ෂා 35 යි මුළුගණන 55 යි.

## අරූපාවචර කුසල්සිත් 4 නම්.

ආකාසානඤ්චායතන කුසල්සිත් 1 යි. විඤ්ඤාණඤ්චායතන කුසල්සිත් 1 යි. ආකිඤ්චඤ්ඤායතන කුසල්සිත් 1 යි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිත් 1 යි. මොහු සතරදෙනද අරූපාවචර කුසල් සිත් නම්වෙත්.

## අරූපාවචර විපාක සිත් 4 නම්.

ආකාසානඤ්චායතන විපාකසිත් 1 යි. විඤ්ඤාණඤ්චායතන විපාකසිත් 1 යි. ආකිඤ්චඤ්ඤායතන විපාකසිත් 1 යි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක සිත් 1 යි. මේ අරූපාවචර විපාකසිත් නම්වෙත්.

## අරූපාවචර ක්‍රියා සිත් 4 නම්.

ආකාසානඤ්චායතන ක්‍රියාසිත් 1 යි. විඤ්ඤාණඤ්චායතනක්‍රියාසිත් 1 යි. ආකිඤ්චඤ්ඤායතනක්‍රියා සිත් 1 යි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියාසිත් 1 යි. මොහු සතරදෙන අරූපාවචර ක්‍රියාසිත් නම් වෙත්. මෙ අරූපාවචරසිතේ උපෙක්ෂා 12 යි.

## ලොකොත්තර සිත් 8 නම්.

සොතාපත්තිමග්ග සිත් 1 යි. සකදාගාමිමග්ග සිත් 1 යි. අනාගාමිමග්ග සිත් 1 යි. අරහත්තමග්ග සිත් 1 යි. මොහු සතරදෙනද ලොකොත්තර කුසල් සිත් නම්වෙත්.

සොතාපත්ති ඵලසිත් 1 යි. සකදාගාමි ඵලසිත් 1 යි. අනාගාමි ඵලසිල් 1 යි. අරහත්තඵලසිත් 1 යි. මේ ඵලසිත් 4 නම්වෙත්.

## විදර්ශනාභාවනාව.

විඤ්ඤාණං අනිච්චං, විඤ්ඤාණං දුක්ඛං, විඤ්ඤාණං අනත්තා—විඥානස්කන්ධයයි කියන අකුසල්සිත් දොළොස කුසල්සිත් විසිඑකෙක විපාකසිත් තිස්හයෙක ක්‍රියාසිත් විස්සකයයි අසූනවයක් ප්‍රභෙදවූ සිත් අනිත්‍යයි. අසූනවයක් ප්‍රභෙදවූ සිත් දුකයි. අසූනවයක් ප්‍රභෙදවූ සිත් අනාත්මයි. කියා භාවනා කටයුතුයි.

---

## චෛතසික 52 නම්.

ඵස්සො, වෙදනා, සඤ්ඤා, චෙතනා, එකග්ගතා, ජීවිතින්ද්‍රියං, මනසිකාරො, යන මොහු සියලු සිත්හි ඒකාන්තයෙන් යෙදෙන බැවින් සබ්බචිත්ත සාධාරණ ධම්මයෝ නම්වෙත්. (7)

විතක්කො, විචාරො, අධිමොක්ඛො, විරියං, පීති, ඡන්දො—යන මොහු ඒ ඒ තැන අනේකප්‍රකාරයෙන් විසිරපවත්නාහෙයින් ප්‍රකීර්ණකසදෙනනම්වෙත්.(6) නැවත මේ තෙලෙස් ධර්මයෝ කුශලපක්‍ෂයෙහි සිත් සමග යෙදුනුකල එම ධර්මයෝ අනික් අකුශලපක්‍ෂයටද අකුශලපක්‍ෂයෙහිසිත්සමග යෙදුනුකල අනික් කුශලපක්‍ෂයටද සමානහෙයින් (සාධාරණහෙයින්) අන්‍යසමානරාසියයි එක්කොට ව්‍යවහාරකරත්.

මොහො, අහිරිකං, අනොත්තප්පං, උද්ධච්චං, ලොභො, දිට්ඨි, මානො, දොසො, ඉස්සා, මච්ඡරියං, කුක්කුච්චං, ථීනං, මිද්ධං, විචිකිච්ඡා—යනමේ තුදුස් චෛතසික ධර්මයන් දෙලොස් අකුශල් සිත්හිම ලැබෙන හෙයින් අකුශල චෛතසිකයෝ නම්වෙත්. (14) සද්ධා, සති, හිරි, ඔත්තප්පං, අලොභො, අදොසො, තත්‍රමජ්ඣත්තතා, කායපස්සද්ධි, චිත්තපස්සද්ධි, කායලහුතා, චිත්තලහුතා, කායමුදුතා, චිත්තමුදුතා, කායකම්මඤ්ඤතා, චිත්තකම්මඤ්ඤතා, කායපාගුඤ්ඤතා, චිත්තපාගුඤ්ඤතා, කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා—යන සොභනසාධාරණචෛතසිකයෝඑකුන්විස්සයි.(19) සම්මාවාචා, සම්මාකම්මන්තා, සම්මා ආජීවො—යන විරති තුනයි. [3] කරුණා, මුදිතා—යන අප්‍රමාණ්‍යයෝ දෙදෙනායි. [2] පඤ්ඤින්ද්‍රිය එකයි. (1) පස්විසි ප්‍රභෙදවූ මේ චෛතසිකයෝ සෝභන චෛතසිකයෝ නම්වෙත්. මුළුගණන 52 යි.

### විදර්ශනාභාවනාව.

සංඛාරා අනිච්චා, සංඛාරා දුක්ඛා, සංඛාරා අනත්තා.

වේදනාදී ස්කන්ධත්‍රයයි කියනලද චෛතසිකයෝ අනිත්‍යයි. වේදනාදී ස්කන්ධත්‍රයයි කියනලද චෛතසිකයෝ දුකයි. වේදනාදී ස්කන්ධත්‍රයයි කියනලද චෛතසිකයෝ අනාත්මයි.

———

## අටවිසිරූපවිභාගය.

පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු, යන සතරදෙන භූතරූපයෝයි. [4]. චක්ඛුං, සොතං, ඝාණං, ජිව්හා, කායො යන පසාදරූපපහයි. (5) රූපං, සද්දො, ගන්ධො, රසො, ආපොධාතුවිවජ්ජිත භූතත්‍රය සඞ්ඛාතං ඵොට්ඨබ්බං යන ගොචරරූප සතරයි. (4) ඉත්ථත්තං, පුරිසත්තං, යන භාවරූප දෙකයි. [2] හදය වත්ථු, යන හදයරූපඑකයි. [1] ජීවිතින්ද්‍රියං, යනජීවිත රූප එකයි. [1] කබලීකාරෙ ආහාරෙ, යන ආහාර රූප එකයි. (1) යන මේ නිෂ්පන්නරූප අටළොස නම්වෙත්. [18] ආකාසධාතු, යන පරිච්ඡේදරූප එකයි. (1) කායවිඤ්ඤත්ති, වචීවිඤ්ඤත්ති, යන විඤ්ඤත්තිරූප දෙකයි. [2] රූපස්සලහුතා, මුදුතා, විඤ්ඤත්තිමයං, යන විකාරරූප තුණයි. (3) රූපස්ස උපචයො, සන්තති, ජරතා, අනිච්චතා, යන ලක්ඛණ රූප සතරයි. [4] මුළුගණන රූප විසිඅටයි. [28] එහෙයින් කීහ.

'භූතප්පසාද විසයා භාවො හදය මිච්චපි
ජීවිතාහාර රූපෙහි අට්ඨාරස විධන්තථා.
පරිච්ඡෙදොච විඤ්ඤත්ති විකාරෙ ලක්ඛණන්තිච
අනිප්ඵන්නාද සචෙති අට්ඨවිස විධංභවෙ"

මෙහි භාවය සතරමහාභූතයෝය. පඤ්චප්‍රසාද යෝය. රූප, ශබ්ද, ගන්ධ, රසසංඛ්‍යාත චතුර්විධ ආලම්බණයෝය ද්විවිධවූ භාවරූපය, හෘදයරූපය, ජීවිත ආහාර රූපදෙක හා සමග අටළොස් වැදෑරුම්වේ. එසේම පරිච්ඡේද රූපයද, ද්විවිධවිඥප්ති රූපද ත්‍රිවිධවිකාරරූපද චතුර්විධ ලක්ෂණ රූපද, යනමේ රූපයන්ගේ පරිච්ඡේද විකාරදීත්වය විනාවෙන ප්‍රත්‍යයන් විසින් අනිෂ්පන්න හෙයින් අනිෂ්පන්න රූපයෝ දසදෙනදැයි අටවිසිවැදෑරුම්වේ.

## විදර්ශනාභාවනාව

රූපං අනිච්චං. රූපං දුක්ඛං, රූපං අනත්තා, අටවිසි වැදෑරුම්වූ විකාරයට පැමිණීම අනිත්‍යයි අටවිසිවැදෑරුම්වූ විකාරයට පැමිණීම දුකයි. අටවිසි වැදෑරුම්වූ විකාරයට පැමිණීම අනාත්මයි.

## නිර්වාණය.

"නිබ්බාණංපන ලොකුත්තරසංඛාතංචතුමග්ගඤාණෙන සච්ඡිකාතබ්බං මග්ගඵලානමාලම්බනභූතං වාණසඞ්ඛාතාය තණ්හාය නික්ඛන්තත්තානිබ්බාණන්තිපවුච්චති" යනුවෙන් නිර්වාණය වනාහි අනාශ්‍රව භාවයෙන් ත්‍රෛභූමිකවූ සංඛ්‍යාතලෝකය ඉක්මෙන බැවින් ලොකොත්තරයයි කියනලද චතුර්විධ මාර්ගඥානයෙන් ප්‍රතිවෙධ කටයුතුවූ මාර්ගඵලයන්ට අරමුණුවූ වාණයයි කියනලද තෘෂ්ණාවෙන් ඉක්මුනුබව හෙයින් නිර්වාණයයි කියනුලැබේ. ඒ මේ නිර්වාණය සවකියවූ ශාන්තලක්ෂණයෙන් ඒකාකාරවූයේද, කාරණ ව්‍යවහාරයෙන් සොපාදිශෙෂ නිර්වාණධාතුය අනුපාදිශෙෂ නිර්වාණධාතුයයි කියා ද්විප්‍රකාරවේ. එසේම සුඤ්ඤතාදී ආකාර භෙදයෙන් සුඤ්ඤතය අනිමිත්තය අප්‍රණිහිතයයි කියා තුන් ප්‍රකාරවේ.

පදමච්චුතමච්චන්තං අසංඛතමනුත්තරං
නිබ්බාණමිති භාසන්ති වාණමුත්තා මහෙසයො.

මෙහිභාවය-තෘෂ්ණාවෙන්මුක්තවූ බුද්ධාදි මහාඍෂීහු චුතිරහිතවූ අන්තරහිතවූ ප්‍රත්‍යය සමුත්පන්න නොවනහෙයින් අසංස්කෘතවූ තමහට අධිකයක්නු නැතිහෙයින්නිරුත්තරවූ ශාන්තපදය නිර්වාණයයි දේශනා කෙරෙත්.

ඉතිචිත්තං චෙතසිකංරූපං නිබ්බාණමිච්චපි
පරමත්ථංපකාසෙන්ති චතුධාව තථාගතාති

මෙසේ චිත්තය චෛතසිකය රූපය නිර්වාණයයි කියාද, පරමාර්ථය සතරපරිද්දෙකින්ම පෙර බුදුවරයන්මෙන් ආහෙයින් තථාගතනම්වූ සර්වඥවරයෝ ප්‍රකාශකෙරෙත්.

## සතරපරමාර්ථයන් ස්කන්ධවශයෙන් බෙදීම්.

මහාභූතයෝ සතරකි. ප්‍රසාදයෝ පසකි. රූප ශබ්ද ගන්ධ රස යන ආලම්බනයෝ සතරයි. ස්ත්‍රීභාවය පුරුෂභාවය යන දෙකයි. හෘදය රූපය ජීවිත රූපය ආහාර රූපයයි මෙසේ නිෂ්පන්නරූප අටළොසකි. භාවරූප එසේම පරිච්ඡේදරූපයවූ ආකාශ ධාතුවය. කාය විඥප්තිවාග් විඥප්තිදෙකයි. ලඝුතා රූපය මුදුතාරූපය කර්මණ්‍යතාරූපයයන විකාර රූප තුනකි. රූපයාගේ උපචය රූපයසන්තතිරූපය ජරතාරූපය අනිත්‍යතා රූපයයන ලක්ෂණරූප සතරයි. මේ අටවිසි රූපය රූපස්කන්ධනම්වේ. මෙසේ දක්වනලද අටවිසිරූපය මිනිස් තිරිසන් ගස් කොලන් කඳුහෙල් දිය ගිනි සුලඟ පොළොවයනාදි සියලු වස්තුවෙහි සුදුසු පරිද්දෙන් හෙවත් අඩුවෂෝ සම්පූර්ණව හෝ ඇත්තේය. ලොව ඇත්තාවූ සියළු සත්වයන්ට හෝ වස්තූන්ට හෝ ඇතුළත්ව තිබෙන ද්‍රව්‍යයන්ගේ ස්වභාව නුවණින් පරීක්ෂාකර බලන්නාහට විසිඅට රූපයමුත් අන්කිසිවක් නොලැබෙනබැවින් රූපස්කන්ධයයි දතයුතුයි. දෙපනස් චෛතසිකයන් අතුරෙන් වේදනාචෛතසිකය. වේදනා ස්කන්ධනම්වේ. අරමුණු රසවිඳීම ස්වභාවලක්ෂණකොට ඇත්තාවූ යම් පමණ අතීතාදී භෙදභින්නවූ වේදනා කෙණෙක්වෙද්ද. ඒ සියලු වේදනාවන් නුවණින් එකතුකොට වේදනා ස්කන්ධයයි ව්‍යවහාරකරති. සංඥාචෛතසිකය සංඥා ස්කන්ධ නම්වේ. මේ සංඥව හඳුනන ලක්ෂණයයි කියනලද ස්වභාවයෙන් එක් වැදෑරුම්වූවත් ජාතිවශයෙන් කුශල සංඥය අකුශල සංඥය අව්‍යාකෘතසංඥයයි තුන්ආකාරවේ. එහි කුශල්සිත් සමග යෙදුනු සංඥව කුසලැයිද අකුසල් සමග යෙදුනු සංඥව අකුසලැයිද, විපාක ක්‍රියා සමග යෙදුනු සංඥව අව්‍යා

කෘතැයිද, ව්‍යවහාරවේයයි දතයුතුයි. විශිෂ්ටවූ පළියෙළ කිරීමහෝ රැස්කිරීම ලක්ෂණකොටඇති චෙතනාව ප්‍රධානකොට ඇති අතීතාදී භෙදභින්නවූ චෛතසිකසම්පර්ණස සංස්කාර ස්කන්ධනම්වේ.

එකුන්අනූවක් ප්‍රභෙද ඇත්තාවූ සිත් විඥාන ස්කන්ධනම්වේ. රූප වේදනා සංඥා සංස්කාර විඥාන යයි කියනලද මේ ස්කන්ධපංචකය දතයුතුයි.

## විදර්ශනා භාවනාව.

පඤ්චක්ඛන්ධා,අනිච්චා පඤ්චක්ඛන්ධා දුක්ඛා, පංචක්ඛන්ධා අනත්තා, පංචස්කන්ධයෝ අනිත්‍යයි. පංචස්කන්ධයෝ දුකයි. පංචස්කන්ධයෝ අනාත්මයි.

## ආයතන වශයෙන් බෙදීම.

අටවිසිරූපයන් අතුරෙන් චක්ෂුඃප්‍රසාදය චක්ඛායතනනම්වේ. ශ්‍රොත්‍රප්‍රසාදය සොතායතනනම් වේ. ඝ්‍රාණප්‍රසාදය ඝාණායතන නම්වේ. ජිව්හාප්‍රසාදය ජිව්හායතන නම්වේ. කායප්‍රසාදය කායායතන නම්වේ රූපාරම්මණය රූපායතනනම්වේ. ශබ්දාරම්මණය ශබ්දායතනනම්වේ. ගන්ධාරම්මණය ගන්ධායතනනම්වේ. රසාරම්මනය රසායතන නම් වේ. ඵොට්ඨබ්බාරම්මනය ඵොට්ඨබ්බායතන නම් වේ. සූක්ෂමරූපහා දෙපණස් චෛතසිකයද නිර්වාණයද ධම්මායතනනම්වේ. එකුන්අනූවක් සිත් මනායතන නම්වේ. මෙසේ දොළොස් අයතනයෙන් සංග්‍රහ කරණලදී.

## විදර්ශනා භාවනාව.

ද්වාදසායතනානි අනිච්චා, ද්වාදසායතනානි දුක්ඛා. ද්වාදසායතනානි අනත්තා. දොළොස් අයතනයෝ අනිත්‍යයි. දොළොස් අයතනයෝ දුකයි. දොළොස් අයතනයෝ අනාත්මයි.

## ධාතු වශයෙන් බෙදීම.

චක්ෂුඃප්‍රසාදය චක්ඛුධාතු නම්වේ. ශ්‍රොත්‍රප්‍රසාදය ශ්‍රොත්‍රධාතුනම්වේ. ඝ්‍රාණප්‍රසාදය ඝ්‍රාණධාතුනම්වේ. ජිව්හාප්‍රසාදය ජිව්හාධාතුනම්වේ. කායප්‍රසාදය කාය විඤ්ඤාන ධාතුනම්වේ. රූපාරම්මනය රූපධාතු

නාමවේ. ශබ්දාරම්මණය ශබ්දධාතු නම්වේ. ගන්ධාරම්මණය ගන්ධධාතු නම්වේ. ස්පර්ශාරම්මණය ඵොට්ඨබ්බධාතු නම්වේ. එකුන්අනූවක් සිත් අතුරෙන් චක්ෂුර් විඥානය චක්ෂුධාතු නම්වේ. ශ්‍රොත්‍රවිඥානය සොතධාතු නම්වේ. ඝ්‍රාණවිඥානය ඝ්‍රාණධාතු නම්වේ. ජිව්හා විඥානය ජිව්හාධාතු නම්වේ. කායවිඥානය කායවිඥාණ ධාතු නම්වේ. සම්පටිච්ඡන යුගලය පංචද්වාරාවර්ජන චිත්තය මනොධාතු නම්වේ. ඉතුරු අටලොස් රූපහා දෙපණස් චෛතසිකයෝද නිර්වාණයද ධම්මධාතු නම්වේ. ඉතුරු අසූඑකක් සිත් මනොවිඥාන ධාතු නම්වේ. මෙසේ අටලොස් ධාතුවෙන් සංග්‍රහකරණලදී.

### විදර්ශනා භාවනාව

ධාතුසමූහං අනිච්චං, ධාතුසමූහං දුක්ඛං, ධාතු සමූහං අනත්තා, ධාතු සමූහය අනිත්‍යයි. ධාතු සමූහය දුකයි. ධාතු සමූහය අනාත්මයි.

### සත්‍යවශයෙන් බෙදීම.

අටවිසිරූපද ලොභචෛතසිකය හැර සෙසු සම්ප්‍රයුක්ත ධර්මසහිතවූ එකුන්අනූවක් සිත්ද දුක්ඛ සත්‍යයි. ලොභචෛතසිකය සමුදය සත්‍යයි. නිර්වාණය නිරොධ සත්‍යයි. සතරමාර්ග සිතෙහි යෙදෙනලද මාර්ගාංග අටමාර්ගසත්‍යයි. මෙසේ දුක්ඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්ගසත්‍යයයන චතුස්සත්‍යයෙන් සංග්‍රහකරණලදී.

—[ සතරපරමාර්ථ විභාගය නිමි ]—

—o—

### "කුසල ධම්මා" යන පදය ස්කන්ධ වශයෙන් බෙදීම.

මෙහි කුශලධර්මයෝනම් කාමාවචර කුසල් සිත් අටය. රූපාවචර කුසල්සිත් පසය. අරූපාවචර කුසල්සිත් සතරය. ලොකොත්තර කුසල්සිත් සතරය යන එක්විසි කුශල චිත්තොත්පාදයෝයි. චිත්තොත්පාද නාමයෙන් සිතද ඒ සිතහා එක්වයෙදෙනාවූ එක්විසිවෙදනා චෛතසික ධර්මයෝද ගන්නා ලැබෙත් ඒ කුසල් සිත් හා එක්වයෙදුනාවූ එක්විසි වේදනා චෛතසිකයෝ වෙදනාස්කන්ධයි. ඒ සිත්හා එක්ව යෙදුනාවූ එක්විසිසංඥාවෝ සංඥාස්කන්ධයි. ඒ සිත්හා එක්ව යෙදුනාවූ ඉතුරු

සංස්කාර ධර්මයෝ සංස්කාර ස්කන්ධයි. සිත් විසිඑක් විඥානස්කන්ධයි. මෙසේ වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන ස්කන්ධ සතරකින් සංග්‍රහකරණ ලදී. එකම රූපස්කන්ධයෙන් සංග්‍රහනොකරණ ලදී.

## ආයතනවශයෙන් බෙදීම.

කාමාවචර රූපාවචරාදී එක්විසි කුසල චිත්තයෝ මනායතනයි. ඒ සිත්හා එක්වයෙදුනාවූ ඵස්සාදී චෛතසිකයෝ ධර්මායතනයි. මෙසේ මනායතන ධම්මායතන දෙකකින් සංග්‍රහකරණ ලදී. ආයතන දසයකින් සංග්‍රහ නොකරණ ලදී.

## ධාතුවශයෙන් බෙදීම.

කාමාවචර රූපාවචරාදී එක්විසි කුසලචිත්තයෝ මනොවිඤ්ඤාණධාතුයි. ඒ සිත්හා එක්වයෙදුනාවූ ඵස්සාදී චෛතසිකයෝ ධම්මධාතුයි. මෙසේ මනොවිඤ්ඤාණධාතු ධම්ම ධාතු දෙකකින් සංග්‍රහ කරණ ලදී. ධාතුසොළසකින් සංග්‍රහනොකරණ ලදී.

## සත්‍යවශයෙන් බෙදීම.

කාමාවචර රූපාවචර අරූපාවචර කුසල් සිත් හා තත්සම්ප්‍රයුක්ත ධර්මයෝද දුඃඛසත්‍යයි. සතර ලෝකෝත්තර මාර්ග සිත්හාඑක්ව යෙදුනාවූ සම්‍යක් දෘෂ්ටිය ආදී මාර්ගාඞ්ග අටමාර්ග සත්‍යයි. ඒ සිත්හා එක්ව යෙදුනාවූ අවශේෂධර්මයන්හා සමග මාර්ගසිත් සත්‍යවිනිර්මුක්තයි. මෙසේ දුඃඛසත්‍යය මාර්ගසත්‍යය යන දෙකින් සංග්‍රහ නොකරණලදී. සමුදය සත්‍යය නිරොධසත්‍යය යන සත්‍යදෙකින් සංග්‍රහනොකරණ ලදී.

---

## "අකුසලා ධම්මා" යන පදය ස්කන්ධ වශයෙන් බෙදීම.

අකුසල ධර්මයෝනම් ලෝභ මූලිකසිත් අටය, ද්වේෂමූලකසිත් දෙකය, මෝහමූලිකසිත් දෙකය යන දෙලොස් අකුසල චිත්තෝත්පාදයෝයි. ඔවුන් අතුරෙන් ඒ සිත් සමග යුක්තවූ දොළොස් වේදනාවෝ වේදනාස්කන්ධයි. දෙලොස් සංඥාවෝ සංඥාස්කන්ධයි. මෝහාදී සෙසුසංස්කාරයෝ සංස්කාර ස්කන්ධයි. දොළොස්සිත් විඥානස්කන්ධයි. මෙසේ ස්කන්ධ සතරකින් සංග්‍රහකරණලදී.

ආයතන වශයෙන් බෙදීම දෙළොස් අකුසල් සිත් මනායතනයි. ඒ සිත් සමග යුක්තවූ චෛතසිකයෝ ධම්මායතනයි. මෙසේ ආයතන දෙකකින් සංග්‍රහකරණලදී. දසයකින් සංග්‍රහ නොකරණලදී.

ධාතු වශයෙන් බෙදීම - දෙළොස් අකුසල්සිත් මනොවිඤ්ඤාණධාතුයි. ඒ සිත්සමග යුක්තවූ චෛතසිකයෝ ධම්මධාතුයි. මෙසේ ධාතු දෙකකින් සංග්‍රහකරණලදී. ධාතු සොළසකින් සංග්‍රහ නොකරණලදී.

සත්‍යවශයෙන් බෙදීම–ලොභ චෛතසිකය හැර ඉතුරු සිත්හා චෛතසික ධර්මයන් සහිතවූ දෙළොස් අකුසල චිත්තෝත්පාදයෝ දුඃඛ සත්‍යයි. ලොභ චෛතසිකය සමුදය සත්‍යයි. මෙසේ සත්‍ය දෙකකින් සංග්‍රහකරණලදී. සත්‍යදෙකකින් සංග්‍රහ නොකරණලදී.

---

"අබ්‍යාකතාධම්මා" යන පදය ස්කන්ධවශයෙන් බෙදීම. අටළොස් අහේතුකසිත්ය. සෙසළොස්කාමාවචර විපාකක්‍රියාසිත්ය. අටළොස් රූපාරූප විපාක ක්‍රියාසිත්ය. සතර ලෝකෝත්තර ඵලසිත්ය.. යන මෙතෙක් නාමධර්මයෝද අටවිසිරූපයෝද නිර්වාණ ධර්මයද යන මොහු අව්‍යාකෘතධර්මයි. ඔවුන් අතුරෙන් අටවිසි රූපය රූපස්කන්ධයි. සියලු චාතුර්භූමික විපාක ක්‍රියාසිත් සමග යුක්තවූ වේදනා සංඥා සංස්කාරයෝ වේදනාස්කන්ධ සංඥාස්කන්ධ සංස්කාර ස්කන්ධයෝයි. එම සිත් විඥානස්කන්ධයි. මෙසේ පංචස්කන්ධයෙන් සංග්‍රහකරණලදී. නිර්වාණ ධර්මය ස්කන්ධවිනිර්මුක්තයි.

ආයතන වශයෙන් බෙදීම–අව්‍යාකෘත අහේතුක සිත්අතුරෙන් චක්ෂුර්විඥානාදී දෙපස්විඥානයෝ ක්‍රමයෙන් චක්ඛායතන සෝතායතන ඝාණායතන ජිව්හායතන කායායතනයෝ වෙති. අටවිසි රූපයන් අතුරෙන් රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශයෝ රූපායතන සද්දායතන ගන්ධායතන රසායතන ඵොට්ඨබ්බායතනයෝ වෙති. ඉතුරු සියළු චාතුර්භූමික විපාකක්‍රියා සිත් මනායතනයි. ඒ සිත් සමග යුක්තවූ චෛතසිකයෝද ඉතුරු රූප ධර්මයෝද; නිර්වාණයද යන මොහු ධර්මායතනයි. මෙසේ දෙළොස් ආයතනයෙන් සංග්‍රහකරණලදී.

ධාතුවශයෙන් බෙදීම - ඇස කණ නාසය දිව කය යන පස පිළිවෙලින් චක්ඛුධාතු සොතධාතු ඝාණධාතු ජිව්හා ධාතු කායධාතු නම්වේත්. රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශන පස පිළිවෙලින් රූප ධාතු සද්ද ධාතු ගන්ධධාතු රසධාතු ඵොට්ඨබ්බ ධාතුවේත්. චක්ෂුර්විඥානාදී දෙපස් විඥානයෝ චක්ඛුවිඤ්ඤාණ ධාතු සොතවිඤ්ඤාණධාතු ඝාණවිඤ්ඤාණධාතු ජිව්හා විඤ්ඤාණධාතු කායවිඤ්ඤාණධාතුහුයි. පංචද්වාරාවජ්ජනසිතය සම්පටිච්ඡනයුගලය (දෙක) මනොධාතුයි. දෙපණස් චෛතසිකයෝය. සොළොස් සූක්ෂමරූපයෝ නිර්වාණයයන මොහු ධම්මධාතුයි මෙසේ අටළොස් ධාතුවෙන් සංග්‍රහකරණලදී.

සත්‍යවශයෙන් බෙදීම–ලොභචෛතසිකයහැර ඉතුරු චෛතසිකධර්මයන්සහිතවූ විපාක ක්‍රියාසිත්ද අටවිසි රූපයෝද දුඃඛසත්‍යයි. ලොභචෛතසිකය සමුදය සත්‍යයි. නිර්වාණධර්මය නිරොධසත්‍යයි. සම්‍යක් දෘෂ්ටියආදී මාර්ගාඞ්ග අටමාර්ගසත්‍යයි.

මෙසේ චතුස්සත්‍යයෙන් සංග්‍රහකරණලදී. මේ කුශලත්‍රිකය සියළුධර්මයන් සංග්‍රහකරණලද බැවින් නිප්පදෙසත්තිකයයි කියනුලැබේ.

මෙහි උපමාවශයෙන් බැලීම. රූපස්කන්ධය ගිලන්සැලකට බඳු උපමාඇත්තේය. වේදනාස්කන්ධය රොගයකටබඳු උපමාඇත්තේය. සංඥාස්කන්ධය රොගනිදානයකට බඳු උපමා ඇත්තේය. සංස්කාරස්කන්ධය නොසැප ආහාරවිහරණාදිය සේවීමකට බඳු උපමා ඇත්තෙය. විඥානස්කන්ධය. ලෙඩෙකුටබඳු උපමා ඇත්තේය. තවද රූපස්කන්ධය භාජනයක් මෙන්ද. වේදනාස්කන්ධය භොජනයක් මෙන්ද. සංඥාස්කන්ධය ව්‍යඤ්ජනයක්මෙන්ද. සංස්කාරස්කන්ධය ආහාරබෙදමින් වළඳවන්නෙක්මෙන්ද විඥානස්කන්ධය අනුභවකරන්නෙක් මෙන්ද දතයුතුයි. රූපස්කන්ධය මැඩීම නොඉවසන බැවින් පෙණපිඬක් වැන්න. වෙදනාස්කන්ධය මොහොතක් සිත්කලු බැවින් දිය බුබුලක්වැනන. සංඥාස්කන්ධය විපරීත ගහණය කරණබැවින් මිරිඟුදියක්වැන්න. සංස්කාර ස්කන්ධය නිස්සාරහෙයින් කෙසෙල් කඳක්

වැත්ත. විඥානස්කන්ධය රවටනහෙයින් මායා කාරයෙක් වැන්නයයි දතයුතුයි. ආයතන සංග්‍රහයෙහි අධ්‍යාත්මික ෂඩායතනයෝ සුන්‍යාගාරයමෙන්ද බාහිර ෂඩායතනයෝ ගම් පහරණ සොරුමෙන්ද උපමා උපමෙය විශයෙන් දතයුතුයි. ධාතුසංග්‍රහයෙහි චක්ඛුධාතුව බෙරඇසක්මෙන්ද: රූපධාතුව පහරණ දණ්ඩක්මෙන්ද. චක්ඛු විඤ්ඤාණධාතුව එයින් නැගිශබ්දයමෙන්ද. නොහොත් චක්ඛුධාතුව දරමෙන්ද. රූපධාතුව ගිනිගානා දණ්ඩක් මෙන්ද. චක්ඛුවිඤ්ඤාණ ධාතුව ගින්නක් -මන්ද. උපමා උපමෙය සංසන්දනයකොට දත යුතුයි. සත්‍යසංග්‍රහයෙහි දුඃඛසත්‍යය බරක්මෙන්ද. සමුදය සත්‍යය බරඔසිලිමක්මෙන්ද. නිරොධසත්‍යය බර බහා තැබීමක්මෙන්ද මාර්ගසත්‍යය බරබහා තබන උපායක් මෙන්ද. නොහොත් දුඃඛසත්‍යය රොගයක් මෙන්ද. සමුදය සත්‍යය රොගනිදානයක් මෙන්ද. නිරුද්ධසත්‍යය රොගසංසිඳීමක් මෙන්ද. මාර්ගසත්‍යය බෙහෙදක්මෙන්ද උපමා උපමෙය සංසන්දනයකොට දතයුතුයි.

---

## බ්‍රහ්මචරිය පඤ්චමක පඤ්චශීලය සමාදන්වන වාක්‍යය

ඔකාස ඔකාස ඔකාස අහම්භන්තෙ තිසරණෙන සහ බ්‍රහ්මචරිය පඤ්චමකං පඤ්චසීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලංදෙථමෙ භන්තෙ, දුතියම්පි අහම්භන්තෙ–පෙ–සීලංදෙථමෙ භන්තෙ, තතියම්පි අහම්භන්තෙ–පෙ–සීලං දෙථමෙ භන්තෙ, අනුකම්පං උපාදාය. මෙසේ යාච්ඤා කළකල්හි සිල් දෙන භික්ෂූන්වහන්සේ විසින් "යමහංවදාමි තං වදෙහි"යි කීකල්හි සිල්සමාදන්වන අය විසින් "ආම භන්තෙ"කිය යුතුයි.

## ශික්ෂාපදපස

පාණාතිපාතා වෙරමණී සික්ඛා පදං සමාදියාමි
අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
සුරාමෙරය මජ්ජපමා දට්ඨානා වෙරමණී
සික්ඛාපදං සමාදියාමි.

එකභත්තිකෂට්ක ශීලය, ඒ පසුව ශීලයෙහි "විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි" යන ශික්ෂාපදය බහා සමාදන්වන්නාවූශීලය එකභත්තිකෂට්කශීලනම්වේ- ආජීවාෂ්ටමක ශීලයනම් "පාණාතිපාතාවෙරමණී' අදින්නාදානාවෙරමණී, කාමේසුමිච්ඡාචාරාවෙරමණී. මුසාවාදා වෙරමණී, පිසුනාවාචා වෙරමණී, ඵරුසාවාචා වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, මිච්ඡාජීවා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, මෙසේ මේ ආජීවාෂ්ටමකශීලය පන්සිල් සමාදන්ව හෝ අටසිල්සමාදන්ව හෝ ඉක්බිති ආජීව පිණිස ප්‍රාණඝාතාදී සප්තවිධ දුශ්චරිතයන් නොකරන්නෙමියි සිත්හි කොටගෙණ මේ පද අට තමාවිසින් කියා සිත්හි ඉටාගන්නේ වීනම් බුඩප්‍රඥප්ත මහානිශංස දසක ශීලයක් සමාදන් වූනාහම් මේ මෙයින් එකභත්තික ෂට්කශීලය සමාදන්වන කල "එකභත්තිකඡක්කසීලං" යනුද මුලින්කී වාක්‍යයටසුදුසුපරිද්දෙන් යොදාගතයුතුයි.

අෂ්ටාඞ්ග උපෝසථශීලය යනු මසකට සතර වරක්හෝ අටවරක්හෝ පස්තුන්මස මුළුල්ල හෝ පක්ෂයක්හෝ යථාශක්තියෙන් සමාදන්ව රක්ෂාකරණ අෂ්ටාඞ්ගශීලයයි. ඒ ශීලය සමාදන්වූ ඉක්බිති "මෙත්තා සහගතෙන චෙතසා පාණභූතෙසු ඵරිත්වා විහරණං සමාදියාමි" යන ශික්ෂාපදය නැවත සමාදන්විය යුතුයි. ඊට අනතුරුව මෛත්‍රීබ්‍රහ්ම විහාරකම්මට්ඨාන් භාවනාව වඩමින් ඒ සැටපැය පසු කල යුතුයි. මේ ශීලය නවඞ්ගුපොසථ ශීලයයි කියනු ලැබේ. නවවැනිව සමාදන්වූ ශික්ෂාපදයෙහි අර්ථ මෙසේයි. මෛත්‍රාසහගතෙන චෙතසා මෛත්‍රීසහගියසිතින්, පාණභූතෙසු, ප්‍රාණභූතයන් කෙරෙහි, ඵරිත්වා, පැතිර, විහරණං, සතරඉරියව් පැවැත්වීම, සමාදියාමි, සමාදන්වෙමි, මිලගට දවස මුළුල්ලේ බැවියයුතු කම්මට්ඨාන් භාවනාව මෙසේයි.

### අනොදිස්ස වශයෙන් මෛත්‍රී 20 යි.

1 සබ්බසත්තා අවෙරාහොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝාහොන්තු සුඛීඅත්තානං පරිහරන්තු-4යි 2 සබ්බ පාණා අවෙරාහොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛීඅත්තානං පරිහරන්තු4යි.3සබ්බෙභූතා අවෙරාහොන්තු අබ්‍යා

පජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු 4යි. සබ්බෙ පුග්ගලා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු 4යි. 5 සබ්බෙ අත්තභාවපරියාපන්නා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු–4.

ඔදිවශයෙන් මෛත්‍රී 28 යි.

සබ්බා ඉත්ථියො අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු–4. සබ්බෙ පුරිසා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු–4යි. සබ්බෙ අරියා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු–4යි. සබ්බෙ අනරියා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු–4යි. සබ්බෙ දෙවා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු–4යි සබ්බෙ මනුස්සා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු4යි. සබ්බෙ විනිපාතිකා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරින්තු–4යි. මෛත්‍රී මුළුගණන 48 යි.

දශ දිසා වශයෙන් මෛත්‍රී වැඩීම.

පුරත්ථිමාය දිසාය සබ්බෙ සත්තා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු. පුරත්ථිමාය අනුදිසාය සබ්බෙ සත්තා අවෙරා හොන්තු–පෙ–පරිහරන්තු, උත්තරාය දිසාය සබ්බෙ සත්තා අවෙරා හොන්තු–පෙ–පරිහරන්තු, උත්තරාය අනුදිසාය සබ්බෙ සත්තා අවෙරා හොන්තු–පෙ–පරිහරන්තු, පච්ඡිමාය දිසාය සබ්බෙ සත්තා–පෙ–පරිහරන්තු, පච්ඡිමාය අනුදිසාය සබ්බෙ සත්තා–පෙ–පරිහරන්තු, දක්ඛිණාය දිසාය සබ්බෙ සත්තා–පෙ–පරිහරන්තු, දක්ඛිණාය අනුදිසා සබ්බෙ සත්තා–පෙ–පරිහරන්තු, හෙට්ඨිමාය දිසාය සබ්බෙ සත්තා–පෙ–පරිහරන්තු, උපරිමාය දිසාය සබ්බෙ සත්තා–පෙ–පරිහරන්තු, පුරත්ථිමාය දිසාය සබ්බෙ පාණා–පෙ– පරිහරන්තු, පුරත්ථිමාය අනුදිසාය සබ්බෙ පාණා-පෙ-පරිහරන්තු, උත්තරාය දිසාය සබ්බෙ

පාණා-පෙ-පරිහරන්තු, උත්තරාය අනුදිසාය සබ්බ පාණා-පෙ-පරිහරන්තු, පච්ඡිමාය දිසාය සබ්බපාණා-පෙ-පරිහරන්තු, පච්ඡිමාය අනුදිසාය සබ්බපාණා -පෙ-පරිහරන්තු, දක්ඛිණාය අනුදිසාය සබ්බපාණා -පෙ-පරිහරන්තු හෙට්ඨිමාය දිසාය සබ්බපාණා -පෙ-පරිහරන්තු, උපරිමාය දිසාය සබ්බපාණා -පෙ-පරිහරන්තු; "සබ්බභූතා" යනාදි අනොදිස්ස පුද්ගලයෝ පස්දෙනද, ඔදිස්සගලයෝ සත්දෙනද, වෙනවෙනම දසදිසාවශයෙන් යොදගත යුතුයි.

මෙහි අනොදිස්ස ඔදිස්ස පුද්ගලයෝ දෙළොස් දෙන එක් දිසාවකට දෙළොස බැගින් ගත්කල්හි

| | |
|---|---|
| දසදිසාශයෙහිම පුද්ගලයෝ | 120 |
| "අවෙරාහොන්තු" යන මෛත්‍රී | 120 |
| "අබ්‍යාපජ්ජාහොන්තු" යන මෛත්‍රී | 120 |
| "අනීඝා හොන්තු" යන මෛත්‍රී | 120 |
| "සුඛිඅත්තානංපරිහරන්තු" යනමෛත්‍රී | 120 |
| මූළු ගණන | 600 |

යටකී පුද්ගලයෝ දෙළොස්දෙන මෛත්‍රී සත රෙන ගිනුකල්හි 48 ක් වෙත්. ඒ ගණනත් 600 ට එකතුකලවිට මෛත්‍රී මූළුගණන 648 යි.

පුරත්ථිමායදිසාය සබ්බපියසත්තා අවෙරාහො න්තු අබ්‍යාපජ්ජාහොන්තු අනීඝාහොන්තු සුඛි අත්තානං පරිහරන්තු. යනාදීන් යටකී ක්‍රමයෙන් ප්‍රිය පුද්ගලයන්ගේ වශයෙන් 164 යි.

පුරත්ථිමායදිසාය සබ්බසහායසත්තා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජාහොන්තු අනීඝාහොන්තු සුඛි අත්තානං පරිහරන්තු, යනාදීන් යහළු සත්වයන්ගේ වශයෙන්—648 යි.

පුරත්ථිමායදිසාය සබ්බමජ්ඣත්ත සත්තා අවෙරාහොන්තු අබ්‍යාපජ්ජාහොන්තු අනීඝා හො න්තු සුඛිඅත්තානං පරිහරන්තු, යනාදීන් මධ්‍යස්ථ පුද්ගලයන්ගේ වශයෙන්—648 යි.

පුරත්ථිමායදිසාය සබ්බවෙරීසත්තා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජාහොන්තු අනීඝාහොන්තු සුඛි අත්තානංපරිහරන්තු, යනාදීන් වෛරීපුද්ගලයන් ගේ වශයෙන්—648 යි. මූළුගණන 2592 යි.

මෙම භාවනාවේ අනු මෙනෙහිකරණ කල්හි මෙසේ දතයුතුයි. සබ්බසත්තා, සියළු සත්වයෝ අවෙරාහොන්තු, ප්‍රාණඝාතාදි අධ්‍යාත්මික සතුරන් පස්දෙනාය. උදකාග්නි රාජචෞරාදී බාහිර සතුරන් පස්දෙනාය යන මොවුන් නැත්තෝ වෙත්වා, අබ්‍යාපජ්ජාහොන්තු ශොකවිනයුතු ව්‍යාපාද නැත්තෝ වෙත්වා. අනීඝාහොන්තු, කායිපාස ලෙඩ රෝද්‍රක් නැත්තෝ වෙත්වා. සුඛී, සුවපත්ව අත්තානං, තමාගේ ආත්මය, පරිහරන්තු, පවත්වත්වායි. මෙසේ මේ පාඨයෙහි අපි අනොදිස්ස ඔදිස්ස වශයෙන්ද. ප්‍රිය පුද්ගල යහළු පුද්ගල මධ්‍යස්ත පුද්ගල වෛරී පුද්ගල යන මොවුන්ගේ වශයෙන්ද. මෛත්‍රී වඩන්ට ඉගෙණ ගතයුතුයි.

### මෙහි ආනිසංසනම්.

ඉමංහිමෙත්තං පටිවාසරක්ඛා
භාවෙති පාතොච දිවාචරත්තිං
සුඛංසුපෙච්චච සුඛංපබුජ්ඣති
සුතොනසුපාපං සුපිනං නපස්සති

මේ මෛත්‍රීභාවනාවයි.

———

### රහත්බව ප්‍රාර්ථනාකරණගාථාව

ඉච්ඡිතා පුඤ්ඤ කම්මෙන
මෙත්තායාසෙව සාවකො
භවාමහං මහාපඤ්ඤා
ජලහිඤ්ඤඝී භික්ඛුකො

නිබ්බාණස්ස පච්චයොහොතු.

### —⫶· කුශලත්‍රිකය නිමි. ·⫶—

# සංඥාපනය.

---

අප ලක්දිව් වැසි බෞද්ධ ජනයාට පරමාර්ථ ධර්ම සංඛ්‍යාත අභිධර්ම මහාසමුද්‍රය තරණය කරනුපිණිස කුඩා පසුරක්වැනිවූ මේප්‍රකරණයෙහි ඇතුළත් ධර්මය බුරුමරටින් ලක්දිවට අවුත් විදර්ශනාධුරයෙහි නියුක්ත ආයුෂ්මත් "උ ජින" මහතෙරුන්වහන්සේ වස්එලඹ දිනපත්‍ර ප්‍රකාශ කෙළේයි. එම ධර්මය අසාප්‍රිතිමත්වූ බෞද්ධමහජනයාවිසින් පොතක් ලියා දුනමැනවයි ආරාධනාකරනලදින් "රත්මලානේ පුෂ්පාරාමාධිපති මාදම්පේ 'විබුද්ධසේනාචාර්ය ධම්මාධාර" ස්ථවිරපාදයන් වහන්සේවිසින් "කුශලත්‍රිකය" නම්වූමෙම ප්‍රකරණය සම්පාදනය කරනලදී.


මෙහිවනාහි චිත්ත, චෛතසික, රූප, නිර්වාණ යන සතර පරමාර්ථයන් සංක්ෂේපවශයෙන් දක්වා විදර්ශනා භාවනා ක්‍රමය හා දැනට ලක්දිව අභාවිතවූ සර්වඥදෙශිත බ්‍රහ්මචරිය පඤ්චමක පඤ්චශීලය ආජීවාෂ්ටමකශීලය එකභත්තික ශීලය නවඞ්ගුපොසථශීලය යන ශීලසමාදාන ක්‍රමයද යොදන ලදී. බුද්ධශාසන මහාසුර සේනාපති ඇම්, ධර්මරත්න පණ්ඩිතුමාවිසින් අවසාන සිද්ධපත්‍රබලා ශුද්ධකරනලදී. මෙම පොත බෞද්ධ පාඨශාලාවන්හි උගත් ශිෂ්‍යයන්ට පරමාර්ථය ඉගැන්වීම පිණිසද අත්‍යෝපකාරවේ. රත්මලානේ සුගතධර්මදූත සමිතිය විසින් බුරුමරටින් ගෙන්වනලද තුන්පිටකයේ පොත්වහන්සේලාගේ බරපැන් ගෙවීමපිණිස මෙයින් ලැබෙන මුදල්පරිත්‍යාගකරනුලබනබවත් සතුටින් මතක් කරම්හ.

මේවගට,

ධර්මදූත සමිතියේ අණපරිද්දෙන්
අන්සත්කලේ ලේකම් තැත්පත්
හෙන්ද්‍රික් මැත්දිස් වෛද්‍යාචාර්ය
තැනය.

1905 ක්‍රිවූ නොවැම්බර් මස
9 වෙනි දින රත්මලානේදීය.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු